ඛක්මහ උළල '11
SINHALA & HINDU NEW YEAR FESTIVAL
தமிழ் சிங்கள புத்தாண்டு
Dandenong Show Ground
Melway Ref. 90 A7
Sunday 17 th of April
උදෑසන 9:00 සිට පැවැත්වේ
contact-
jagath-0411644503
Sarath-0407818831
ශ්‍රී ලංකා ජර්මාණු කාර්මික අභ්‍යාස ආයතනයීය ආදි ශිෂ්‍ය සංගමය ඔබ සැමට සහභාගි වන ලෙස සාදරයෙන් ඇරයුම් කරයි.

සිඩ්නි නුවර ඛක්මහ රංගනයට මව්බිමින්

සහන් රන්වල

හෙළ ජන ගීය වෙනුවෙන් ඇප කැපව මහඟු මෙහෙවරක් කළ ඩබ්ලිව්. බී. මකුලොලුව, සී. ද ඇස්. කුලතිලක වැනි සූධීන් අනුමග යමින් එකී සද්කර්තව්‍යය ඉදිරියට ගෙන ආ පසුකාලීන කලා කරුවන් අතරින් කැපී පෙනෙන දෙපළකි ලයනල් රන්වල හා රෝහණ බැද්දගේ ශිල්පීන් දෙපළ. ඔවුන් අතරින් ලයනල් රන්වලයන් සිය සිසු පිරිස සමගනී ජන ගීය වෙනුවෙන් කළා වූ සේවය නොකඩවා ඉදිරියට ගෙන යාමට අද මව් බිමේ උර දී සිටින්නේ එතුමන්ගේ කණිටු පුත්‍ර රත්‍රනයවන සහන් රන්වල යෞවනයායි. ජන ගීය වෙනුවෙන් කැප වුණ නූතන පරපුරේ පුරෝගාමී චරිතයකි සහන්.

පියාණන් මෙන්ම ගායනයට, තනු හා සංගීත නිර්මාණයට, රංගනයට, කථිකත්වයට උපන් හපන්කම් පානා සහන් වේදිකා නාට්‍ය පිටපත් රචකයෙකු හා අධ්‍යක්ෂ වරයෙකු ද විය. ඒ රාජ්‍ය නාට්‍ය උළෙලේ සම්මානයට පාත්‍ර වූ "වෙලාව කීයද ?" වේදිකා නාට්‍යයෙනි. සිය පියාණන් ඉදිරිපත් කළ "ගම අවුලඤ්ඤං", "අහසේ ඉන්නවලු" ජන ගී ප්‍රසංග ද්විත්වයෙහි ලයනල් රන්වල ජන ගී කණ්ඩායම සමගින් කටයුතු කරමින් ලත් හුරුව එතුමාණන් ගේ වියෝවෙන් පසුව එම කණ්ඩායම සමගින් ඉදිරියට ගෙන ආවේ "පොඩි අයට ජන ගී", "මේ අවුරුදු කාලේ" වැනි ප්‍රසංග තමන් විසින් ම නිර්මාණය කරමින්. ඊට අමතරව වැඩි පිරිසකගේ දායකත්වයෙන් යුත් "රන්වල බලකාය" සඳහා "යුද්දෙටත් ඇවිත්" හා "ත්‍රී" යන ප්‍රසංග ද්විතවය ද අධ්‍යක්ෂණය කරමින් ඉදිරිපත් කිරීම සහන් රන්වලයන්ගේ යෞවන සංවිධාන හා නිර්මාණ ශක්තිය මොනවට කියා පායි. පියාණන් විසින් කොළඹ ජන කලා කේන්ද්‍රයේ ඇරඹූ "තාලම" ජන ගී පාඨමාලාව මේ දක්වා පවත්වාගෙන යන අතරම දිවයින පුරා දේශන හා වැඩමුළු පවත්වමින් කරගෙන යන්නා වූ වැඩ පිළිවෙල ප්‍රශංසනීයයි. ඉහත කී සෑම ප්‍රසංගයක් වෙනුවෙන් ම නිකුත් කළාවූ සංගත තැටි සඳහා සහන්ගේ දායකත්වය හා මූලිකත්වය වෙසෙසින්ම සඳහන් කළ යුතුය.

නිදහස් වැඩසටහන් නිශ්පාදකවරයෙකු, ඉදිරිපත් කරන්නෙකු වශයෙන් ජාතික රූපවාහිනිය, "ස්වර්ණවාහිනිය", "සිරස", ස්වාධීන රූපවාහිනිය වැනි දෘෂ්‍ය නාලිකා වෙනුවෙන් මෙන් ම "සිරස", "සත්", "හිරු" වැනි ගුවන් විදුලි ශ්‍රව්‍ය නාලිකා වෙනුවෙන් ද සහන්ගෙන් ලැබෙන්නේ නොමැඳ දායකත්වයකි.

කොළඹ විශ්ව විද්‍යාලයේ කළමණාකරණ හා මූල්‍ය පීඨයේ අලෙවිකරණය පිළිබඳව විශේෂ උපාධිය ලබා ගනිමින් සිය ප්‍රථම උපාධිය සම්පූර්ණ කළ සහන් රන්වලයන්, ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ලේඛණ සහ ජන සන්නිවේදනය පිළිබඳව පශ්චාත් උපාධියත්, බෞද්ධ අධ්‍යාපනය පිළිබඳව පශ්චාත් උපාධියත් සම්පූර්ණ කළේය. ඊට අමතරව කැළණිය විශ්ව විද්‍යාලයේ නාට්‍ය හා රංගකලාව පිළිබඳව හාස්ත්‍රපති උපාධිය සම්පූර්ණ කළ සහන් කොළඹ නීති විද්‍යාලයේ ඉගෙනීම ලබා නුදුරේදීම නිතීඥයෙකු ලෙසින් දිවුරුම් දීමට නියමිතයි. සහන් රන්වල කොළඹ ආනන්ද විද්‍යාලයීය ආදි ශිෂ්‍යයෙකි.

ඕස්ට්‍රේලියාවේ නිව් සවුත් වේල්ස්හි සිංහල සංස්කෘතික සංගමය විසින් මෙවරත් පැවැත්වීමට යෙදෙන "බක් මහ රංගන" ප්‍රසංගය වෙනුවෙන් ඉදිරිපත් කෙරෙන තරුණ හමුවේ අංග පුහුණු කරවීමත් ඒ සමගින් සිය හැකියාවන් දැක්වීමත් සඳහා සහන් රන්වලයන් සහභාගි වීමට නියමිතයි.

සිංහල හා හින්දු අළුත් අවුරුද්ද වෙනුවෙන් නිව් සවිත්වේල්ස්හි, සිඩ්නි නුවර කාසල් හිල්ස් මධ්‍යස්ථානයේදී 2011 අප්‍රේල් 30 වන සෙනසුරාදා සවස 6.30 ට "බක් මහ රංගන" ප්‍රසංගය ඇරඹීමට සිංහල සංස්කෘතික සංගමය (Singhalese Cultural Forum) සංවිධානය කර ඇත්තේය.

ලාභ උපදනා සංවිධානයක් නොවන සිංහල සංස්කෘතික සංගමයේ දැක්ම වන්නේ ඕස්ට්‍රේලියාවේ බහුසංස්කෘතිකත්වය නගඩා සිටුවීමයි. වසර 20 කට පෙර පිහිටුවනු ලැබූ මෙම සංගමයේ එදා මෙදා තුර සිඩ්නි නගරයේ පැවැත්වීමට යෙදුනා වූ අංගයන් නිසාවෙන් ම එය එම ප්‍රාන්තයේ මුල්තැන ගත් සංවිධානයක් බවට පත් ව ඇත්තේය. සිංහල සංස්කෘතික කලාංගයන්ගෙන් සපිරි බක්මහ රංගන සිංහල කතා කරන " නොකරන දෙපිරිසම අතර ජනප්‍රියත්වයට පත්ව තිබීම සතුටට කාරණයකි.

මෙවන් ප්‍රසංගයක් වෙනුවෙන් කලා කරුවෙකු, ශිල්පියෙකු මෙන්ම වෘත්තිකයෙකු වූ ද නොයෙක් හපන්කම් පානා සුරුවෙකු වූ ද, නැවුම් දේ නිර්මාණය කරනා යෞවනයෙකු වූද සහන් රන්වලයන් හට ආරාධනා කර දායක කරගැනීම කාලීන වැදගත් කමකින් යුත් මහඟු සද්කාර්යයකි. වෙසෙසින් ම සිංහල අවුරුදු කාලයේ මව් බිමට ද නැතිවම බැරි එවැනි දෑ හිතකාමියෙකුගේ වටිනාකම නිසියාකාරව තක්සේරු කිරීම වෙනුවෙන් සිංහල සංස්කෘතික සංගමයට කෘතවේදී විය යුතු වේ.

සිසිර දිසානායක

SEND MONEY TO SRI LANKA
EXCELLENT Service and Exchange Rates!
It's Easy, Fast, Secure and Affordable.
Ria MONEY TRANSFER
customer service 1(800)701-488
දැන් ඔබේ මුදල් විශ්වාසවන්තව ලංකාවට යවන්න
තවත් සූරිය සේවාවක්
ලෝ සුපතල Ria MONEY TRANSFER
හොඳම විනිමය අනුපාත - විශ්වාසදායී සේවාව
සූරිය Sooriya
ඔබේ වෙළඳ සල
132 - 1B Alexander Av Thomastown Vic 3074 Tel - 9465 8257
www.sooriya.com.au
සූරිය - හිරු මෙන් විශ්වාසයි